# සුමති
# කලාභිමන්
## සිව්වන දශකාගමනය




# සුමති
# සම්මාන
## SUMATHI AWARDS
## 2026




# සුමති 2026

## SUMATHI AWARDS

රූපවාහිනී ප්‍රමිති කරන
අභිෂේක රාත්‍රිය

වර්ෂ දෙදහස් විසිහයක් වූ
ජූලි මස 15 වැනි දින
ශ්‍රී ජයවර්ධනපුර, මොනාක් ඉම්පීරියල් පරිශ්‍රයේදී...

**සංස්කරණය**
ගීත් ගුණසේකර

**පිටු සැලසුම් උපදේශකත්වය**
උචිත කනන්කේආරච්චි

**පරිගණක පිටු සැලසුම**
නුවන් අබේදීර

සුමති
සම්මාන
SUMATHI AWARDS

# රූපවාහිනී කලාවේ **නොබිඳුණු අභිමානය**

**1995** වසරේදී සාඩම්බර ආරම්භය සනිටුහන් කළ "සුමති සම්මාන උළෙල" සතු ප්‍රධානතම අභිප්‍රාය වනුයේ, මෙරට ටෙලිනාට්‍ය, රූපවාහිනී නිර්මාණයන් මෙන්ම වෙළෙඳ දැන්වීම් ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඇගයීමට ලක්කරමින් එහි ප්‍රමිතිය ඉහළ නැංවීමයි. එමඟින් ශ්‍රී ලාංකේය ටෙලි නිර්මාණකරුවන් සහ සමස්ත රූපවාහිනී කර්මාන්තය දිරිගන්වන අතරම, දේශීය සීමාවන් අතික්‍රමණය කරමින් අපගේ නිර්මාණ ජාත්‍යන්තර තලයට රැගෙන යෑම සඳහා ඔවුන්ව දිරිමත් කිරීම ද මෙහි අරමුණකි.

දේශීය සංස්කෘතියට සහ උදාර සම්ප්‍රදායන්ට ප්‍රමුඛස්ථානය ලබාදෙමින්, අපේ අනන්‍යතාවන් සුරක්ෂිත කොට රැකගැනීමට කැපවන "සුමති සම්මාන උළෙල" ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩවම පවත්වාගෙන එනු ලබන එකම සහ ප්‍රමුඛතම රූපවාහිනී සම්මාන උළෙල ලෙස අභිෂේක ලබා ඇත.

සීග්‍රයෙන් දියුණු වන තාක්ෂණික ලෝකය සමඟ පෙරට ඇදෙන මෙරට නිර්මාණකරණය, වත්මනෙහි සම්ප්‍රදායික රූපවාහිනී සීමාවන් ද අතික්‍රමණය කරමින් පවතී. ඒ අනුව සමාජ මාධ්‍ය (Social Media) ඔස්සේ ද අතිමහත් ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනා ගැනීමට නිර්මාණකරුවන් සමත්ව ඇත. ගෝලීය වශයෙන් සිදුවන මෙම තාක්ෂණික හා සමාජයීය පරිවර්තනයන් හඳුනාගනිමින්, සුමති සම්මාන උළෙල ද කාලීන අවශ්‍යතාවන්ට අනුව නිරන්තරයෙන් යාවත්කාලීන වේ. ඒ අනුව, පෙර වසරවල පරිදිම මෙවර ද සමාජ මාධ්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටතාවන් උදෙසා ද සම්මාන පිරිනැමීමට කටයුතු යොදා ඇත.

විශේෂයෙන්ම, මෙම සියලු ඇගයීම් සිදුකරනු ලබන්නේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් අපක්ෂපාතී සහ විද්වත් විනිසුරු මඩුල්ලක් (Jury) මඟිනි. එම නිසාම, සුමති සම්මාන උළෙල සැමවිටම මෙරට කලා ක්ෂේත්‍රයේ ඉහළම විනිවිදභාවයකින් යුතු, අතිශය සාධාරණ සහ විශ්වසනීයම සම්මාන උළෙලක් ලෙස නොබිඳුණු ගෞරවය දිනා සිටියි.



# සම්මාන උළෙලේ 31 වැනි පියවර සහ
# ලාංකේය රූපවාහිනියේ ගමන්මඟ

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ක්‍රියාත්මක සමස්ත ජනසන්නිවේදන මාධ්‍යයන් අතරින් වඩාත් ජනප්‍රිය සහ ප්‍රබලතම මාධ්‍යය ලෙස සැලකෙන්නේ රූපවාහිනියයි. 1979 වසරේදී ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් රූපවාහිනී යන්ත්‍රය, අද වනවිට සෑම නිවසකම නැතුවම බැරි පොදු භාණ්ඩයක් බවට පත්ව ඇත. ඉන් අනතුරුව 1982 පෙබරවාරි 15 වන දින, 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මඟින් නිල නීතිමය රාමුවකට යටත්ව ජාතික රූපවාහිනී විකාශනය ආරම්භ විය. එතැන් පටන් මෙරට ජන ජීවිතය සමඟ අතිශය සමීපව බද්ධ වෙමින්, සමාජයීය වශයෙන් දැවැන්ත බලපෑමක් එල්ල කිරීමට රූපවාහිනී මාධ්‍යයට හැකි වී තිබේ.

## ටෙලිනාට්‍ය කලාවේ ආගමනය

රූපවාහිනියේ ආගමනයත් සමඟ ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන් අතර වඩාත්ම ජනප්‍රිය වූ අංගය වූයේ ටෙලිනාට්‍ය කලාවයි. මිනිස් මනසේ සහ හදවතේ සියුම් තැන් ස්පර්ශ කිරීමට ඇති හැකියාවත්, සමාජයේ මෙන්ම පුද්ගල ජීවිතවල යථාර්ථය මැනවින් ප්‍රතිබිම්බය කිරීමට සමත්වීමත් ටෙලිනාට්‍ය මෙතරම් ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනා ගැනීමට ප්‍රමුඛතම හේතුව විය.

ජාතික රූපවාහිනිය හරහා විනෝදාස්වාදය සැපයීමේ අරමුණින් ඇරඹි මෙම කලාවේ සමාරම්භය සනිටුහන් කළේ ආචාර්ය ඩී. බී. නිහාල්සිංහයන්ගේ "දිමුතු මුතු" ටෙලිනාට්‍යයයි. එය ලංකාවේ විකාශය වූ ප්‍රථම වර්ණ ටෙලිනාට්‍යය ද වෙයි. එදා මෙදා තුර විවිධ හැලහැප්පීම්, බාධක මෙන්ම නව තාක්ෂණික පෙරළීන් සමඟ මුසුවෙමින් ශ්‍රී ලාංකේය ටෙලිනාට්‍ය කලාව අද වනවිට ඉතා දිගු ගමනක් පැමිණ තිබේ.

## පුංචි තිරයේ මහා කලා මංගල්‍යය

මෙලෙස විකාශනය වූ රූපවාහිනී නිර්මාණකරණයේ සැබෑ විශිෂ්ටත්වය සහ කලාකරුවන්ගේ කුසලතා ඇගයීමට ලක් කරමින් 1995 වසරේදී "සුමති සම්මාන උළෙල" ආරම්භ විය. තිලංග සුමතිපාල මහතාගේ සංකල්පයකට අනුව "පුංචි තිරයේ මහා කලා මංගල්‍යය" ලෙස ඇරඹි මෙම උළෙල, අද වනවිට රංගන ශිල්පීන් පමණක් නොව රූපවාහිනී ක්ෂේත්‍රයේ තිරය පිටුපස සිටින සෑම නිර්මාණකරුවෙකුම උදෙසා වෙන් වූ, මෙරට පැවැත්වෙන උත්කර්ෂවත්ම සහ කීර්තිමත් කලා මහෝත්සවය බවට පත්ව ඇත.

## සුවිශේෂී වාර්තාවක්

රූපවාහිනී මාධ්‍යය පමණක් අරමුණු කරගනිමින්, අඛණ්ඩව දශක තුනකට අධික කාලයක් මෙවැනි දැවැන්ත සම්මාන උළෙලක් නොකඩවා පවත්වාගෙන යාම දේශීය වශයෙන් පමණක් නොව, ගෝලීය මාධ්‍ය ඉතිහාසයේ ද තැබූ සුවිශේෂී වාර්තාවකි.

## නව දශකයකට පියවර තබන සුමති සම්මානය

මෙවර සුමති සම්මාන උළෙල තවත් දශකයකට පෙරවදනක් ලියමින් තම අභිමානවත් 31 වන පියවර සනිටුහන් කරයි. මෙපමණ කාලයක් පුරා මෙවැනි දැවැන්ත උළෙලක් අඛණ්ඩව පැවැත්වීම අතිශය අභියෝගාත්මක කටයුත්තක් වුවද, සුමති සම්මාන සංවිධායක කමිටුව එම අභියෝගය සාර්ථකව ජයගෙන ඇත.

මෙම සම්මාන උළෙලේ ඇති සුවිශේෂීම ලක්ෂණය වන්නේ එය එකතැන පල්නොවන, ගලායන සිහිල් දිය දහරක් බඳු වීමයි. කාලානුරූපීව වෙනස් වෙමින්, මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා නිවැරදිව හඳුනා ගනිමින්, වසරෙන් වසර අවශ්‍ය පරිදි නව සම්මාන ඛණ්ඩ එකතු කිරීමට ද සංවිධායක මණ්ඩලය නිරන්තරයෙන් කටයුතු කරයි. තාක්ෂණයේ සහ රසවින්දනයේ නව මානයන් කරා පියනඟන වත්මන් රූපවාහිනී කර්මාන්තයට 31 වැනි වරටත් දිගහැරෙන සුමති සම්මාන අභිමන්තාව සැබැවින්ම දැවැන්ත ශක්තියකි. පෙරගමන්කරුවෙකි.

## හෙට දවස උදෙසා තබන සපථය

සුමති සම්මාන උළෙල තිස් එක් වසරක අතීතය වර්ණවත් කළේ හුදෙක් සම්මාන පිරිනැමීමෙන් පමණක්ම නොවේ. ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයාගේ රසඥතාව ඉහළ නැංවීමටත්, ගුණාත්මක නිර්මාණ බිහිකිරීමටත් කලාකරුවා දිරිමත් කිරීම එමඟින් අඛණ්ඩව සිදු කෙරුණි. එමඟින් රූපවාහිනී කර්මාන්තයේ ගුණාත්මක 'ප්‍රමිතිකරණය' සඳහා පැහැදිලි මුද්‍රාවක් තැබීමට හැකි විය.

සකලවිධ කලාවන්ටම ගෝලීය මෙන්ම දේශීය වශයෙන් ද නොයෙක් අභියෝග එල්ල වී ඇති වත්මන් වටපිටාවක, මෙවර පැවැත්වෙන සුමති සම්මාන උළෙල පෙරටත් වඩා සුවිශේෂී අගයක් ගනී.

පසුගිය දශක තුනක සාඩම්බර මතකයන් සිහිපත් කරමින් එළඹෙන මෙම සම්මාන රාත්‍රිය, හුදෙක් එක් රැයක සැණකෙළියක් පමණක් නොවේ. එය ලාංකේය රූපවාහිනී කලාවේ හෙට දවස වඩාත් අර්ථපූර්ණ, කලාත්මක සහ තාක්ෂණික වශයෙන් පොහොසත් එකක් බවට පත් කිරීමට තැබෙන සාක්ෂියක් මෙන්ම, කලා ලොව ආලෝකවත් කරන නොනිමෙන ප්‍රදීපස්තම්භයකි.



## කාලයේ පියවර සටහන් මතින් අභිමානවත් සිව්වන දශකයකට පා තබන

# සුමති සම්මානාවලෝකනය

මීට දශක තුනකට පෙර දේශීය කලා ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා මා දුටු සුන්දර සිහිනය, අද හෙළ රූපවාහිනී වංශකතාවේ මහා වෘක්ෂයක් ලෙස නැඟී සිටිනු දැකීම මහත් වූ නිහතමානී ආඩම්බරයකි. වසර 30ක ඓතිහාසික සන්ධිස්ථානය පසුකර අප තබන 31 වන පියවර, නොසැලෙන ආත්ම විශ්වාසයෙන් පිරි මගේ ජීවිතයේ මෙන්ම ශ්‍රී ලාංකේය රූපවාහිනී කලාවේ ද අගනා පරිච්ඡේදයකි.

සුමති සම්මාන ඉතිහාසය යනු හුදෙක් අලංකාර සම්මාන රාත්‍රියක් පමණක් නොවේ. එය මෙරට කලාකරුවන්ගේ දක්ෂතාවය නිසි ඇගයීමට ලක් කරමින් දේශීය රූපවාහිනී කලාවේ ප්‍රමිතිය ජාත්‍යන්තර තලයට ඔසවා තැබූ, දේශීය නිර්මාණකරණය “ප්‍රමිතිකරණයට ලක් කරන දැවැන්ත සංස්කෘතික මෙහෙවරකි”.

වර්තමානයේ අප රට මුහුණ දී සිටින ආර්ථික අර්බුදය හමුවේ, මෙරට ප්‍රේක්ෂකයා පිනවන අපේ කලාකරුවා ද පෙර නොවූ විරූ දැඩි ජීවන සහ වෘත්තීය අභියෝගයකට ලක්ව සිටී. මෙවැනි අසීරු වටපිටාවක වුවද, අප සුමති සම්මාන උළෙල අඛණ්ඩව පවත්වනු ලබන්නේ පීඩාවට පත් කලාකරුවාගේ මානසිකත්වය නඟාසිටුවීමට සහ ඔවුන් දිරිමත් කිරීමටය. එසේම කලාවට සහ මාධ්‍යයට හිමි නිසි ගෞරවය නොසැලී පවත්වාගෙන යෑම සඳහාය.

විවිධ අභියෝගයන් මෙන්ම අනපේක්ෂිත අර්බුද හමුවේ වුවද, වසර 31ක් පුරා කිසිදු වසරක අප, අපගේ ප්‍රමිතිය හෝ විශ්වසනීයත්වය බාල කර නැත. ඒ සෑම කඩඉමකදීම අප නොසැලී නැඟී සිටියේ කලාවට අවංකවම ආදරය කළ අනුග්‍රාහක භවතුන්ගේ සහ රසික ජනතාවගේ ශක්තිමත් සහයෝගය අප වටා බැඳී තිබූ බැවිනි.

දේශීය රූපවාහිනී කර්මාන්තය නැවත සක්‍රීය කිරීමට නම් කලාකරුවන්, මාධ්‍ය ආයතන, අනුග්‍රාහකයන් සහ ප්‍රේක්ෂකයන් එකිනෙකාට ශක්තියක් වෙමින් අත්වැල් බැඳගත යුතුය. ඒ සාමූහික ප්‍රයත්නය උදෙසා පෙරගමන්කරුගේ භූමිකාව ඉටු කිරීමට “සුමති සම්මාන උළෙල” සැමවිටම සූදානම්ය.

එදා මෙදාතුර අපක්ෂපාතීව සහ වගකීමෙන් යුතුව නිවැරදි තීන්දු තීරණ ලබාදුන් විනිශ්චය මණ්ඩලයන්හි ගරු සභාපතිවරුන් ඇතුළු සාමාජිකයන් සියලුදෙනාවද මම මේ මොහොතේ ඉතා ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි.

සමස්ත උත්සවයේ ගුණාත්මකභාවය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සංවිධානය කිරීමට අප නිරතුරු වෙහෙසෙන්නේ, අපගේ කලාකරුවන්ට සහ මාධ්‍යවේදීන්ට උපරිම සාධාරණය ඉටුකිරීම උදෙසාය. මෙකී උදාර අරමුණ සාක්ෂාත් කරගැනීමට අප සමඟ එක්ව කටයුතු කරන්නාවූ සියලුම රූපවාහිනී නාලිකා ප්‍රධානීන් ඇතුළු මාධ්‍ය ක්ෂේත්‍රයේ සහෘදයන්, අප ලැබූ ගෞරවයේ සම අයිතිකරුවන්ය.

31 වන වරටත් පැවැත්වෙන මේ අභිමානවත් සුමති සම්මාන රාත්‍රියට එකතුවී සිටින ඔබ, සැමවිටම අපගේ හෘද සාක්ෂියයි. ප්‍රේක්ෂක හදවත් දිනාගත් ප්‍රවීණ මෙන්ම නවක කලාකරුවන් සහ මාධ්‍යවේදීන් අපේ අහසේ පායන සදාකාලික පහන් තරුය. ඒ තාරකාවන්ගේ ආලෝකයෙන් හෙළ කලාවේ අනාගත පරපුර සුපෝෂණය වේ නම්, එය අප ලැබූ විශාලම ජයග්‍රහණයයි.

අභියෝග ජයගත් සුබ අනාගතයක් ඔබ සැමට ප්‍රාර්ථනා කරමි!

**ආචාර්ය තිලංග සුමතිපාල**
**නිර්මාතෘ, සභාපති**
**සුමති සම්මාන උළෙල**





# තේමා ගීතය

රංගන නර්තන තරඟ සරසියේ
පංකජ උද්‍යානයේ
කිත්සර නංවන තිලිණ සාදයේ
මංගල ප්‍රභාතයේ

සුමති ප්‍රසාදන සත්සර සාධන
සුරම්‍ය සන්ධ්‍යාවයි
ඇසි දිසි රූ සර කලා නිමාකළ
ඒ සර දැහැනින් දැයම වශීකළ
නිමයුම් සිත්මල් රසික සරසියේ

පිපී දිලෙන දවසයි
පිදුම් ලබන මොහොතයි

සරසවි රස සෙව් දැයේ කලා පෙළ
තරු කැළ සේ දිලි දිලී සභා ගැබ
සුපැතුම් මුතුලැල් සලන සරසියේ
සිනා කිරණ විසිරෙයි
කලා කෙතම බැබළෙයි

ගායනය
**සුනිල් එදිරිසිංහ**

ගීත රචනය
**කුලරත්න ආරියවංශ**

සංගීත නිර්මාණය
**ආචාර්ය රෝහණ වීරසිංහ**



# සුමතිපාල අනුස්මරණ සම්මානය



මවකගේ සෙනෙහසේ කිරි බිඳුවෙන් ද, පියෙකුගේ නළලතින් ගලා හැලෙන දහඩිය හා කඳුළු බිඳුවෙන් ද දරුවන්ගේ ජීවිත පෝෂණය වෙමින් ආලෝකමත් වන්නේය යන විශ්වීය සත්‍යතාව මිනිස් සංහතිය පවතිනතාක්කල් නොවෙනස්ව පවතින්නකි. මෙලොව උපන් දා පටන් තමන් නොලද ලෝකයද, තමන් අත්නොවිඳි සැප සම්පත් මෙන්ම උගත්කමද, තම දරුවාට උරුම කර දීම වෙනුවෙන් දෙමාපියන් ඉටු කරනු ලබන අසිරිමත් කැපකිරීම් අතිමහත්ය. එබැවින්, ආදරණීය දෙමාපියන් යනු දරුවන්ගේ ජීවිත ප්‍රදීපාගාරයන් වන අතර, ඔවුහු කිසි කලෙකත් මිය නොයන, සදාතනික වූ අමරණීය මතකයන් වන්නාහ.

මෙරට සිංහල සිනමාවේ මෙන්ම සමස්ත කලා ක්ෂේත්‍රයේ ද උන්නතිය උදෙසා අසමසම යුග මෙහෙවරක් ඉටුකළ අතිජාත කලාලැදියන් දෙපළක් ලෙස යූ. ඩබ්ලිව්. සුමතිපාල මැතිතුමා සහ ආචාර්ය මිලිනා සුමතිපාල මැතිණිය ඉතිහාසයට එක්ව සිටිති. විශේෂයෙන්ම, 1978 වසරේ ඊජිප්තුවේ කයිරෝ නුවර පැවැති තෙවන ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, අග්‍රගණ්‍ය සිනමාවේදී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාණන් අධ්‍යක්ෂණය කළ "අහසින් පොළොවට" (White Flower For The Dead) සිනමාපටය, තෙවන ලෝකයේ හොඳම චිත්‍රපටය වෙනුවෙන් පිරිනමන ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් ලැබීමට මූලික පදනම වැටුණේ ද මොවුන්ගේ දායකත්වයෙනි. තම ආදරණීය දෙමාපියන් කලා ලොවේ ප්‍රගතිය උදෙසා ඉටුකළ ඒ අනුපමේය සේවාව සමාජයීය වගකීමක් හා පරම යුතුකමක් කොට සලකන සුමතිපාල පරපුර, සෑම වසරකම "සුමති සම්මාන උළෙල" අතිඋත්කර්ෂවත් අන්දමින් සංවිධානය කරමින්, මෙරට ප්‍රවීණ මෙන්ම, නවක කලාකරුවන්ගේ දක්ෂතා හා කුසලතා ඇගයීමට ලක් කරති.

අභාවප්‍රාප්ත යූ. ඩබ්ලිව්. සුමතිපාල මැතිතුමා සහ ආචාර්ය මිලිනා සුමතිපාල මැතිණියගේ මහෝන්නත නාමයන් සදාතනිකව සිහිපත් කරනු වස්, එම ආදරණීය දෙමාපියන් වෙත කෙරෙන උත්කෘෂ්ට උපහාරයක් ලෙස "සුමතිපාල අනුස්මරණ සම්මානය" ප්‍රදානය කිරීමට සංවිධායක මණ්ඩලය තීරණය කර ඇත්තේ මෙම උදාර වූ කෘතවේදී අරමුණ පෙරදැරි කරගෙනය. කලා ක්ෂේත්‍රයේ දිගුකාලීනව නියැළෙමින්, කලාවේ චිරස්ථිතිය උදෙසා තම ජීවිතයම කැප කළ ප්‍රවීණ කලාකරුවෙකු, කලාකාරිනියක, විශිෂ්ට නිර්මාණකරුවෙකු හෝ කලාව නියෝජනය කරනු ලබන විවිධ විෂය පථයන්ට අයත් ශිල්පීන් අතුරින් වසරක් පාසා තෝරාගන්නා අසහාය කලා පෞරුෂයන් දෙකකට මෙම අභිමානවත් සම්මානය පිරිනමනු ලබයි.

කලාකරුවෙකුගේ සමස්ත ජීවිත කාලය තුළදීම එක් වරක් පමණක් හිමිවන අතිවිශේෂ, ගෞරවනීය ඇගයීමක් වීම මෙම සම්මානයේ ඇති සුවිශේෂීම සලකුණයි.

කලා ක්ෂේත්‍රයේ අභිමතාර්ථ සංකේතවත් කරමින් පිරිනමනු ලබන මෙම විශිෂ්ට ස්වර්ණමය සම්මානය නිර්මාණය කර ඇත්තේ, ප්‍රවීණ චිත්‍ර ශිල්පී අතුල උපසිරි කල්දේරා මහතාණන් විසිනි.





එදා මෙදාතුර

# සුමතිපාල අනුස්මරණ සම්මානයෙන් පිදුම් ලැබුවෝ...

| | |
|---|---|
| 1995 | ඩී. බී. නිහාල්සිංහ |
| 1996 | ටයිටස් තොටවත්ත |
| 1997 | ගාමිණී ෆොන්සේකා |
| 1998 | දෙනවක හාමිනේ<br>හියුගෝ ප්‍රනාන්දු |
| 1999 | ජෝ අබේවික්‍රම<br>කේ. ඒ. ඩබ්. පෙරේරා |
| 2000 | ටෝනි රණසිංහ<br>ක්‍රිස්ටි ලෙනාඩ් පෙරේරා |
| 2001 | අයිරාංගනී සේරසිංහ<br>මාලනී ෆොන්සේකා |
| 2002 | හෙන්රි ජයසේන<br>රවින්ද්‍ර රන්දෙණිය |
| 2003 | සතිස්චන්ද්‍ර එදිරිසිංහ<br>රොබින් ප්‍රනාන්දු |
| 2004 | විජේරත්න වරකාගොඩ<br>ලතා වල්පොල |
| 2006 | ශාන්ති ලේඛා<br>ශාන් වික්‍රමසිංහ |
| 2007 | නන්දා මාලනී<br>ස්ටැන්ලි පෙරේරා |
| 2008 | රෝයි ද සිල්වා<br>රෙක්ස් කොඩිප්පිලි |
| 2009 | කැලැරිස් ද සිල්වා<br>ජීවරාණී කුරුකුලසූරිය |
| 2010 | මහාචාර්ය සුනිල් ආරියරත්න<br>ශ්‍රියානි අමරසේන |
| 2011 | අනුලා කරුණාතිලක<br>ඇන්ජලින් ගුණතිලක |
| 2012 | සිරිල් වික්‍රමගේ<br>වික්ටර් රත්නායක |
| 2013 | පුණ්‍යා හීන්දෙනිය<br>සනත් නන්දසිරි |
| 2014 | ආචාර්ය රෝහණ වීරසිංහ<br>සුජාතා අත්තනායක |
| 2015 | ඒ. ඩී. රංජිත් කුමාර<br>ඉන්ද්‍රාණී විජේබණ්ඩාර |
| 2016 | අමරසිංහ කලංසූරිය<br>අනෝජා වීරසිංහ |
| 2017 | නීටා ප්‍රනාන්දු<br>ස්වර්ණා මල්ලවආරච්චි |
| 2018 | ගීතා කුමාරසිංහ<br>තිස්ස විජේසුරේන්ද්‍ර |
| 2019 | ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු<br>සුමනා අමරසිංහ |
| 2020<br>2021 | ඩග්ලස් රණසිංහ<br>මානෙල් වානගුරු |
| 2022<br>2023 | සනත් ගුණතිලක<br>ඉන්ද්‍රානි පෙරේරා |
| 2024 | ප්‍රියා සූරියසේන<br>ධර්මසිරි බණ්ඩාරනායක |
| 2025 | සුනිල් එදිරිසිංහ<br>වීණා ජයකොඩි |

# ජීවිතයේ එක්වරක් පමණක් පිරිනැමෙන සුමතිපාල අනුස්මරණ සම්මානය 2026

## එඩ්වඩ් ජයකොඩි

ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත, පණ්ඩිත් අමරදේව, මහාචාර්ය සනත් නන්දසිරි, ආචාර්ය වික්ටර් රත්නායක යුගයෙන් යුගයේ ස්ථාපිත කළ ශ්‍රී ලාංකේය සුභාවිත ගීත සම්ප්‍රදාය ඉදිරියට ගමන් කරද්දී සුනිල් එදිරිසිංහයන්ට පසුව හමුවන අනුප්‍රාප්තිකයා ඔහුය.

1954 අප්‍රේල් 06 වැනිදා කෑගල්ලේ හෙට්ටිමුල්ලේ උපත ලද ඔහු බණ්ඩාරනායක කනිටු විදුහල, කෑගල්ලේ ශාන්ත මරියා විදුහල හා නුගවෙල මධ්‍ය මහා විදුහල ආදියෙන් අකුරු කළේය. කුඩා අවධියේ සිටම සංගීතයට ඇලුම් කළ හේ රජයේ සංගීත විද්‍යාලයෙන් ද ඉක්බිතිව ලක්නව් හි භාත්ඛණ්ඩේ සංගීත විද්‍යාලයෙන් ද තත් විෂය ප්‍රගුණ කළේය. 1973 “කරදිය ගැඹරේ” ගීතය ගායනා කරමින් ගායන ලොවට ප්‍රවිෂ්ට වූ ඔහු “සීතල පිණිමත, කැරකෙන රෝදේ, සමනලයා මල හා ළමයා සේ” වැනි ගීත ඔස්සේ සුභාවිත ගීත ක්ෂේත්‍රයේ ජනප්‍රිය ගායනවේදියකු බවට පත්විය. ළමා පරපුර සඳහා ද අගනා ගීත රාශියක්ම නිර්මාණය කළ හේ කොළඹ නාලන්දා විද්‍යාලය, කැලණිය ගුරුකුල විද්‍යාලය ආදියෙහි සංගීත ගුරුවරයකු ලෙස ද සුවිශාල මෙහෙවරක් ඉටු කළේය. මෙරට සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළ නැංවීමට ද ඔහුගෙන් වෙසෙස් මෙහෙවරක් ඉටුවිය.




වේදිකා හා ටෙලි නාට්‍ය රැසක සංගීත අධ්‍යක්ෂවරයා වූ ඔහු ස්පාටකස්, කොන්ත නෝනා, ගජමන් පුවත, සෙක්කුව ඇතුළු නාට්‍ය රැසක රංගන ශිල්පියකු ලෙස ද කැපී පෙනිණ. ඔහු මෑත භාගයේ ගුත්තිල චිත්‍රපටයේ ප්‍රධාන චරිතය නිරූපණය කළේය. ගෙදර බුදුන් අම්මා, සෙයිලම, මංගල තෑග්ග, සරෝජා ඇතුළු චිත්‍රපට ගණනාවක පසුබිම් ගායනයෙන් දායක වූ හේ සරසවි, ස්වර්ණ සංඛ, රාජ්‍ය නාට්‍ය යන සම්මානවලින් මතුනොව, සබරගමු විශ්වවිද්‍යාලයීය යාවජීව සම්මානයෙන්ද සිග්නීස් ලයිෆ් ටයිම් සම්මානයෙන්ද පිදුම් ලැබුවේය.

ජනප්‍රිය ගායන ශිල්පිනී චරිතා ප්‍රියදර්ශනී පීරිස් සමඟ විවාහවීමෙන් ඉක්බිතිව එඩ්වඩ් චරිතා සුසංයෝගය මෙරට සුභාවිත ගීත කලාවට නැවුම් ආස්වාදයක් ගෙනාවේය.

“මාරම්බරී” ඔස්සේ ප්‍රසංග වේදිකාව ද ඒකාලෝක කරන ඔහුගේ කලා ජීවිතයට දැන් අඩසියවස ඉක්මවා ඇත. කලා ලොවට යුගකාරක මෙහෙවරක් ඉටු කළ කෘතහස්තයන්ට ජීවිතයේ එක් වරක් පමණක් පිරිනමන සුමතිපාල අනුස්මරණ සම්මානය මෙවර පිරිනැමෙන්නේ ජයකොඩි ආරච්චිගේ දොන් එඩ්වඩ් තිමති ජයකොඩි හෙවත් එඩ්වඩ් ජයකොඩි ප්‍රවීණ සංගීතවේදියාණන්ටය.



ඡායාරූපය - දයාන් විතාරණ

# ජීවිතයේ එක්වරක් පමණක් පිරිනැමෙන සුමතිපාල අනුස්මරණ සම්මානය 2026

**සුවිනීතා වීරසිංහ**

හැටේ දශකයෙහි සිනමාවට පිවිසි කුසලතා පූර්ණ නිළියන් අතර ප්‍රමුඛ පෙළේ රූපණවේදනියක වූ ඇය 1944 මැයි 19 වැනිදා දෙහිවල උපත ලබා ගල්කිස්ස බෞද්ධ බාලිකා විද්‍යාලය, දෙහිවල මධ්‍ය මහා විද්‍යාලය ආදියෙන් අකුරු කළාය.

පාසල් සමයේ වේදිකා නාට්‍ය කිහිපයක රඟපෑ ඇය ක්‍රීඩාවට මෙන්ම නර්තනයට ද දැල්මක් දැක්වූවාය. උඩරට නැටුම් කලාව හදාරා ගාන්ධර්ව විභාගයෙන් සමත් වූ ඕ ජ්‍යෙෂ්ඨ විභාගය සමත්ව ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට ඇතුළත්වීමේ විභාගයට ද පෙනී සිටියාය. එහි ප්‍රතිඵල නිකුත් වන්නටත් පෙර අලුත් නළු නිළියන් ඉල්ලා පුවත්පතක පළ වූ දැන්වීමකට ඉල්ලුම් කළ ඇය රොබින් තම්පෝගේ "සුහද දිවි පිදුම" චිත්‍රපටයේ නැටුම් දර්ශනයක ද "සුදු සළේ කළු වලා" චිත්‍රපටයේ ප්‍රධාන චරිතය ද රඟපාමින් 1963 දී සිනමාවට පිවිසිණ.

"සුදෝ සුදු" චිත්‍රපටයේ හීන් මැණිකා, "දෙලොවක් අතර" හි චිත්‍රා, "වැලිකතර" හි ගීතා රන්දෙණිය, "සිකුරුලියා" චිත්‍රපටයේ නාමලී, "හුලවාලි" හි සුභා, "සසරක පැතුම්" හි වෛද්‍ය ශාන්ති, "මලට නොඑන බඹරු" හි ස්ටෙලා, "සතිපූජා" හි මියගිය සැමියා වෙනුවෙන් තම දිවිය කැප කරන බිරිඳ, "යුගාන්තය" හි නාලිකා වැනි භූමිකා ඔස්සේ ඇය ප්‍රේක්ෂක හදවත් තුළ නොමැකෙන සිහිවටන තැබුවාය.

විවිධ තාඩන, පීඩනවලට ගොදුරුවන ස්ත්‍රීත්වය මෙබඳු චිත්‍රපට ඔස්සේ ප්‍රතිභාන්විතව මූර්තිමත් කළ ඇය, එච්. ඩී. ප්‍රේමරත්නගේ "සඳුන්ගිර ගිනි ගනී" ටෙලි නළුවෙන් පුංචි තිරයට ද පිවිසුණාය. කලින් කල පැන නැඟුණු යොවුන් විලාසිතා හා බද්ධ වෙමින්, ජනප්‍රිය සිනමාවේ සැහැල්ලු චරිත රඟපෑ අවස්ථා ද ඇයගේ සිනමා ජීවිතය තුළ හිඟ නොවේ. සකුන්තලා, අනුපමා යන චිත්‍රපට ඊට නිදර්ශනවේ.

ජීවිතයේ එක්වරක් පමණක් හිමිවන "රණතිසර" සරසවිය සම්මානයෙන් ද ඇය පිදුම් ලැබුවාය. "මම සහ සිනමාව" මැයෙන් තම ස්වයං ලිඛිත අපදානය වසර ගණනාවකට පෙර ඇය එළිදැක්වූවාය.

ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයට සුවිශිෂ්ට මෙහෙවරක් ඉටුකළ කලාකරුවකුට හෝ කලාකාරිනියකට ජීවිතයේ එක් වරක් පමණක් හිමිවන "සුමතිපාල අනුස්මරණ සම්මානය" මෙවර හිමිවන්නේ සිනමාවේ 65 වසරක් පුරා රූපණ කලාව එකලුකොට වත්මනෙහි චිත්‍රපට අධ්‍යක්ෂවරියක ලෙස දොරට වැඩීමේ අපේක්ෂාවෙන් සිටින සුවිනීතා වීරසිංහ නම් වූ ප්‍රතිභාපූර්ණ රූපණවේදිනියටය.





ඡායාරූපය - දයාන් විතාරණ



## 2026 සුමති සම්මාන සමඟ
## අත්වැල් බැඳගත් අනුග්‍රාහකයෝ

THI tech without limits
SUMATHI VENTURES
HOME LANDS TRUST | INNOVATION | EXCELLENCE
Touch of Gold
napco Your Impression is Our Responsibility
MONARCH IMPERIAL
RESISTANCE
COMMERCIAL BANK
DHANANJAYA BANDARA
LOVI CEYLON

31 සුමති සම්මාන
SUMATHI AWARDS | 2026




**සුමති සම්මාන** සමඟ ඇති සුහදශීලී විශ්වාසනීයත්වයේ ප්‍රතිඵලයක් ලෙස මෙරට පෞද්ගලික අංශයේ ආයතන රැසක් අඛණ්ඩව තිස් වසරක් පුරා සුමති සම්මාන උළෙල සමඟ අනුග්‍රහකයන් ලෙස රැඳී සිටිති. ඒ අනුව මෙවර සුමති සම්මාන රාත්‍රිය වර්ණ ගැන්වීමට ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස එක්ව සිටින්නේ ***THI*** පෞද්ගලික සමාගමයි.
එයට අමතරව සුමති වෙන්චර්ස් පෞද්ගලික සමාගම, ***Resistance,*** ටච් ඔෆ් ගෝල්ඩ් ***(Touch of Gold)*** මොනාච් ඉම්පීරියල් (***Monach Imperial***), කොමර්ෂල් බැංකුව, හෝම් ලෑන්ඩ්ස් ***(Home Lands)*** සහ නැප්කෝ පෞද්ගලික සමාගම යන මෙරට ප්‍රමුඛ පෙළේ ආයතන රැසක අනුග්‍රාහක දායකත්වය මෙවර සුමති සම්මාන උළෙල සඳහා ලැබී ඇත.













සම්මාන සඳහා නිර්දේශිත නාම ප්‍රකාශ කිරීමේ මාධ්‍ය හමුව කලාකරුවන්ගේ ද සහභාගීත්වයෙන් කොළඹ, ***NH Collection*** හෝටලයේදී 2026 ජුනි 23 වැනිදා ඉතා උත්කර්ෂයෙන් සිදුකෙරිණි.




31
සුමති
සම්මාන
SUMATHI AWARDS | 2026
THi
napco
THi


www.thi.lk












# සුමති සම්මාන - 2026 සම්මාන නාමාවලිය

| | | | |
|---|---|---|---|
| 1 | හොඳම ප්‍රාසංගික ටෙලිනාට්‍ය සහ නාලිකාව | 2 | හොඳම ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණය |
| 3 | හොඳම රූපවාහිනී ටෙලිනාට්‍ය තිර රචනය | 4 | හොඳම ටෙලිනාට්‍ය කැමරා අධ්‍යක්ෂණය |
| 5 | හොඳම ටෙලිනාට්‍ය සංගීත අධ්‍යක්ෂණය | 6 | හොඳම රූපවාහිනී ටෙලිනාට්‍ය අංගරචනය |
| 7 | හොඳම ටෙලිනාට්‍ය කලා අධ්‍යක්ෂණය | 8 | හොඳම ටෙලිනාට්‍ය කලා අධ්‍යක්ෂණය |
| 9 | හොඳම ටෙලිනාට්‍ය ගීත රචනය | 10 | හොඳම ටෙලිනාට්‍ය ගායනය |
| 11 | හොඳම ටෙලිනාට්‍ය නළුවා | 12 | හොඳම ටෙලිනාට්‍ය නිළිය |
| 13 | හොඳම ටෙලිනාට්‍ය සහාය නිළිය | 14 | හොඳම ටෙලිනාට්‍ය සහාය නළුවා |
| 15 | හොඳම ටෙලි චිත්‍රපටය | 16 | හොඳම ටෙලිනාට්‍ය නැඟී එන නළුවා |
| 17 | හොඳම ටෙලිනාට්‍ය නැඟී එන නිළිය | 18 | ළමා තාරකාව |
| 19 | හොඳම රූපවාහිනී වාර්තා වැඩසටහන | 20 | හොඳම රූපවාහිනී සංගීත වැඩටහන |
| 21 | හොඳම රූපවාහිනී කාලීන වැඩසටහන | 22 | හොඳම රූපවාහිනී පූරක |
| 23 | හොඳම රූපවාහිනී සඟරාමය වැඩසටහන | 24 | හොඳම රූපවාහිනී ක්‍රීඩා වැඩසටහන |
| 25 | ජූරියේ විශේෂ සම්මාන | 26 | ජූරියේ විශේෂ සම්මාන |
| 27 | හොඳම රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන | 28 | හොඳම රූපවාහිනී ළමා වැඩසටහන |
| 29 | හොඳම රූපවාහිනී ග්‍රාෆික සජීවීකරණය (ත්‍රිමාණ ඩිජිටල් සජීවීකරණය) | 30 | හොඳම රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදක (2 වන ස්ථානය) |
| 31 | හොඳම රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදක (1 වන ස්ථානය) | 32 | හොඳම රූපවාහිනී ගවේෂණශීලී වාර්තාකරණය (2 වන ස්ථානය) |
| 33 | හොඳම රූපවාහිනී ගවේෂණශීලී වාර්තාකරණය (1 වන ස්ථානය) | 34 | හොඳම රූපවාහිනී දේශපාලන වැඩසටහන (3 වන ස්ථානය) |
| 35 | හොඳම රූපවාහිනී දේශපාලන වැඩසටහන (2 වන ස්ථානය) | 36 | හොඳම රූපවාහිනී දේශපාලන වැඩසටහන (1 වන ස්ථානය) |
| 37 | හොඳම රූපවාහිනී කාලීන පුවත් වාර්තාකරණය (2 වන ස්ථානය) | 38 | හොඳම රූපවාහිනී කාලීන පුවත් වාර්තාකරණය (1 වන ස්ථානය) |
| 39 | හොඳම රූපවාහිනී ප්‍රවෘත්ති විකාශනය (News Bulletin) | | |

## එදා මෙදාතුර ජනප්‍රිය නළුවා සහ ජනප්‍රිය නිළිය සම්මානයෙන් පිදුම් ලැබුවෝ

| | | |
|---|---|---|
| 1995 | කමල් අද්දරආරච්චි | නිල්මිණි තෙන්නකෝන් |
| 1996 | ලකී ඩයස් | චාන්දනී සෙනෙවිරත්න |
| 1997 | ජීවන් කුමාරතුංග | වසන්ති චතුරානි |
| 1998 | පාලිත සිල්වා | යශෝධා විමලධර්ම |
| 1999 | ශ්‍රියන්ත මෙන්ඩිස් | යශෝධා විමලධර්ම |
| 2000 | ලකී ඩයස් | යශෝධා විමලධර්ම |
| 2002 | චන්න පෙරේරා | යශෝධා විමලධර්ම |
| 2003 | චන්න පෙරේරා | කාංචනා මෙන්ඩිස් |
| 2004 | රොෂාන් පිලපිටිය | නයනා කුමාරි |
| 2006 | රොෂාන් පිලපිටිය | චතුරිකා පීරිස් |
| 2007 | සුරාජ් මාපා | ඕෂදී හේවාමද්දුම |
| 2008 | රොෂාන් රණවන | මංජුලා කුමාරි |
| 2009 | චන්දික නානායක්කාර | නෙහාරා පීරිස් |
| 2010 | චන්දික නානායක්කාර | උමයංගනා වික්‍රමසිංහ |
| 2011 | සාරංග දිසාසේකර | උදාරි වර්ණකුලසූරිය |
| 2012 | ධනංජය සිරිවර්ධන | නදීෂා හේමමාලි |
| 2013 | විශ්ව කොඩිකාර | දිනක්ෂි ප්‍රියසාද් |
| 2014 | විශ්ව කොඩිකාර | රුවන්ගි රත්නායක |
| 2015 | කාවිංග පෙරේරා | ශලනි තාරකා |
| 2016 | කාවිංග පෙරේරා | ඉෂාරා සඳමිණි |
| 2017 | කාවිංග පෙරේරා | නයනතාරා වික්‍රමරච්චි |
| 2018 | රවීන් කණිෂ්ක | ශලනි තාරකා |
| 2019 | සුමිරාන් ගුණසේකර | නයෝමි තක්ෂිලා |
| 2020/21 | සජිත අනුත්තර | සෙනාලි ෆොන්සේකා |
| 2022/23 | උද්දික ප්‍රේමරත්න | දුෂේනි මියුරංගි |
| 2024 | සාරංග දිසාසේකර | දුෂේනි මියුරංගි |
| 2025 | සාරංග දිසාසේකර | දිනක්ෂි ප්‍රියසාද් |

## එදා මෙදාතුර හොඳම නළුවා සහ ජනප්‍රිය නිළිය සම්මානයෙන් පිදුම් ලැබුවෝ

| | | |
|---|---|---|
| 1995 | බුද්ධදාස විතානආරච්චි | මානෙල් ජයසේන |
| 1996 | ලකී ඩයස් | චාන්දනී සෙනෙවිරත්න |
| 1997 | ජැක්සන් ඇන්තනි | මාලිනී ෆොන්සේකා |
| 1998 | අශෝක පීරිස් | වසන්ති චතුරානි |
| 1999 | සුමින්ද සිරිසේන | චාන්දනී සෙනෙවිරත්න |
| 2000 | ජෝ අබේවික්‍රම | නිල්මිණී තෙන්නකෝන් |
| 2001 | ශ්‍රියන්ත මෙන්ඩිස් | මාලිනී ෆොන්සේකා |
| 2002 | ජයලත් මනෝරත්න | වසන්ති චතුරානි |
| 2003 | මහේන්ද්‍ර පෙරේරා | සසන්ති ජයසේකර |
| 2004 | සුමින්ද සිරිසේන | දුලීකා මාරපන |
| 2005 | ජයලාල් රෝහණ | දුලීකා මාරපන |
| 2006 | ජනක් ප්‍රේමලාල් | දමිතා අබේරත්න |
| 2007 | රොජර් සෙනෙවිරත්න | චාන්දනී සෙනෙවිරත්න |
| 2008 | ශ්‍රියන්ත මෙන්ඩිස් | වසන්ති චතුරානි |
| 2009 | ශ්‍රියන්ත මෙන්ඩිස් | දුලීකා මාරපන |
| 2010 | රොෂාන් රවීන්ද්‍ර | හිමාලි සයුරංගි |
| 2011 | ජගත් චමිල | සමාධි ලක්සිරි |
| 2012 | විශ්වජිත් ගුණසේකර | කාංචනා මෙන්ඩිස් |
| 2013 | ජැක්සන් ඇන්තනි | පබෝද සංදීපනී |
| 2014 | ජනක් ප්‍රේමලාල් | තිසුරි යුවනිකා |
| 2015 | ශ්‍රියන්ත මෙන්ඩිස් | නිල්මිණී තෙන්නකෝන් |
| 2016 | සුමති රත්නායක | උමාලි තිලකරත්න |
| 2017 | ශ්‍යාම් ප්‍රනාන්දු | නදී කම්මැල්ලවීර |
| 2018 | උද්දික ප්‍රේමරත්න | තිසුරි යුවනිකා |
| 2019 | රොෂාන් රවීන්ද්‍ර | සමනලී ෆොන්සේකා |
| 2020 | දසුන් පතිරණ | උදාරි වර්ණකුලසූරිය |
| 2021 | තුසිත ලක්නාත් | උමාලි තිලකරත්න |
| 2022 | මධුර ප්‍රභාෂ්වර | නයෝමි තක්ෂිලා |
| 2023/24 | ජගත් මනුවර්ණ | සේමිණී ඉද්දමල්ගොඩ |
| 2025 | ප්‍රියන්ත සිරිකුමාර | තරින්දි ප්‍රනාන්දු |




# සුමති සම්මාන - 2026 **විනිශ්චය මණ්ඩලය**

**සම්මානිත මහාචාර්ය,**
**ආචාර්ය මුදියන්සේ දිසානායක (සභාපති)**



කොළඹ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ අංශාධිපති, පීඨාධිපති පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යක්ෂ, අනු මණ්ඩල දොළහකින් යුත් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති ආදී ලෙස තමා සේවිත කලා ප්‍රකාරය ප්‍රාසංගික උත්කර්ෂයෙන් හා ප්‍රයුංජන ශිල්ප කෞශල්‍යයෙන් සමෘද්ධව, ජාතික හා ජාත්‍යන්තර සම්මාන රැසක් දිනා ගැනීමට සමත් වූ සම්මානිත මහාචාර්ය මුදියන්සේ දිසානායක වූ කලි පෘථුලව සාධිකව පැතිර ගිය අනුපම ශක්‍යතා සමූහයක සමායෝගයකි. සංගීතය, ඡායාරූපකරණය, නළුවරණය, ජන මූල බස, සංස්කෘතිය, ගැමි නාට්‍ය, නාට්‍ය, ටෙලිනාට්‍ය, චිත්‍රපට ඈ බහු විධ කලා ක්ෂේත්‍ර පිරියෙසුම්කර ශාස්ත්‍රාභිලාෂී ඡාත්‍ර ගණයා, විදග්ධ පර්ෂද් මධ්‍යයට රැගෙන ගිය, පර්යේෂණ සඳහා ආචාර්ය උපාධියක් ලබාගත් ප්‍රථම ශ්‍රී ලාංකික ප්‍රාසංගික ශිල්පියා මෙන්ම ශ්‍රී ලංකාවේ නර්තනය පිළිබඳ මහාචාර්ය පදවියලත් ප්‍රථම ප්‍රාසංගික ශිල්පියා ද වේ.

---

**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආචාර්ය**
**උපුල් රංජිත් හේවාවිතානගමගේ**



කැලණිය විශ්වවිද්‍යාලයෙන් හින්දි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියත්, දර්ශනපති උපාධියත් ලබා දිල්ලියේ ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියත් ඔහු ලබා ඇත. හින්දුස්තානී සංගීතය හදාරා භාත්ඛණ්ඩේ විශ්වවිද්‍යාලයෙන් වාද්‍ය විශාරද උපාධිය ලබා තිබේ. එසේම ඔහු රාජ්‍ය සාහිත්‍ය සම්මානලාභී ලේඛකයෙකි, පරිවර්තකයෙකි. වේදිකා නාට්‍ය, ගුවන්විදුලි සරල ගීත සහ කෙටි චිත්‍රපට සංගීත අධ්‍යක්ෂවරයෙකි. රාජ්‍ය සාහිත්‍ය උපදේශක සභාවේ හිටපු උපසභාපතිවරයෙකි. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය, සිග්නිස් සම්මාන උළෙල, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ආනයනික විදෙස් ටෙලිනාට්‍ය සහ චිත්‍රපට සමීක්ෂණ මණ්ඩලය ආදියෙහි හිටපු සාමාජිකයෙකි. ජාත්‍යන්තර හා ජාතික සම්මානවලින් පවා පිදුම් ලබා ඇති ඔහු වෘත්තාන්ත චිත්‍රපට කිහිපයක භාෂා සුපරීක්ෂකවරයකු ලෙස කටයුතු කර ඇති අතර හඬකැවීම් ශිල්පියෙකු ලෙසද කටයුතු කරයි.

---



**නිර්මාණ අධ්‍යක්ෂ**
**චින්තක රණවීර**

විසි වසරකට අධික, කාලයක් වෙළෙඳ දැන්වීම් ක්ෂේත්‍රය තුළ නිර්මාණ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරන චින්තක රණවීර කොළඹ විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ ජනමාධ්‍යපති උපාධිධාරියෙකි. එසේම ඔහු ඡායාරූපකරණය, චිත්‍ර ශිල්පය, ග්‍රැෆික් නිර්මාණ ශිල්පය පිළිබඳ ඩිප්ලෝමාලාභියෙකු ද වෙයි. ප්‍රකට මාධ්‍ය ආයතන කිහිපයක මාධ්‍යවේදියකු ලෙස ද කටයුතු කර ඇති චින්තක රණවීර බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස ද කලක් කටයුතු කළේය. ඔහු විවිධ ක්ෂේත්‍රයන් හි කලා නිර්මාණ සඳහා අර්ථපතීත්වයෙන් දායකත්වය දැක් වූ අයෙකි.






**සම්මානිත සිනමාවේදිනී,**
**අසංකා මොණරවිල අබේසේකර**

දෙස්, විදෙස් සිනමාව තුළ තිර කතා රචිකාවක, නිෂ්පාදන සැලසුම්කරණ ශිල්පිනියක, නිෂ්පාදන කළමනාකරණවරියක, නිෂ්පාදන සම්බන්ධීකාරකවරියක, නිෂ්පාදිකාවක මෙන්ම සහය අධ්‍යක්ෂකවරියක ලෙස ද ප්‍රකට අසංකා මොණරවිල, ආචාර්ය ජේම්ස් පිරිස්ගේ 'The God King' චිත්‍රපටයේ රඟපාමින් සිනමා රංගනයට ද එක් විය.

'වත්සලා අක්කා' චිත්‍රපටයේ තිර රචනය වෙනුවෙන් ඕ.සී. අයි. සී. සම්මානයෙන් පිදුම් ලැබූ ඇය ජාත්‍යන්තර සිනමාපට රැසකට නිෂ්පාදන සම්බන්ධිකරණයෙන් සිය දායකත්වය ලබා දී තිබේ. ඇය සහය අධ්‍යක්ෂණයෙන් දායකවූ ජාත්‍යන්තර චිත්‍රපට අතරින් නේපාලයේ 'සූර්ය මුඩ්' කැපී පෙනෙයි. වර්තමානයේදී ඇය සිනමා ක්ෂේත්‍රයට පිවිසි තරුණ පරපුර වෙනුවෙන් සිය සම්පත් දායකත්වය නිර්ලෝභිව ලබා දෙන්නීය.



**ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී,**
**නිශානි දිසානායක**

වසර හතළිහකට අධික කාලයක් මාධ්‍යවේදිනියක ලෙස කටයුතු කරන නිශානි දිසානායක ලක්බිම පුවත්පතේ ප්‍රාදේශීය පුවත්පත් කතුවරිය, විදෙස් පුවත් කතුවරිය සහ සමුදුර පුවත්පතේ කතුවරිය ලෙස සේවය කර තිබේ.
මේ වනවිට ඇය ලොව සුප්‍රකට යොවුන් කතා සහ නවකතා විසි පහක් සහ කෙටිකතා එකතුවක් සිංහලයට පරිවර්තනය කර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව ඇතුළු රටවල් ගණනාවක කෙටි ශිෂ්‍යත්ව හා වැඩමුළු සඳහා සහභාගි වී ඇති ඇය විශ්ව දැනුම් පිළිබඳ විශිෂ්ටතම මාධ්‍යවේදිනිය ලෙසද සම්මාන ලබා තිබේ. සාහිත්‍ය, ජනමාධ්‍ය සම්මාන හා ටෙලිනාට්‍ය උළෙලයන් හි ජූරි සභා සාමාජිකාවක ලෙස කටයුතු කර ඇති ඇය ටෙලිනාට්‍ය සමීක්ෂණ මණ්ඩලවල කටයුතු කර තිබේ. ඇය වර්තමානයේ දී දකුණු ආසියානු කාන්තා මාධ්‍ය ජාලයේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරයි.

## වෙළෙඳ දැන්වීම්කරණය සහ ඩිජිටල් සම්මාන විනිශ්චය මණ්ඩලය

- **ආචාර්ය තිලංග සුමතිපාල** - සභාපති, සුමති සම්මාන
- **ආචාර්ය ධම්ම දිසානායක** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දේශපාලන විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
- **ආචාර්ය තිලිණි ද සිල්වා** - නියෝජ්‍ය උපකුලපති (අධ්‍යයන), NSBM Green University
- **සන්තුෂ් වීරමන්** - සභාපති, SGM Films (Pvt) Ltd.
- **ලයිලා ගුණසේකර** - උප සභාපති, Dentsu Grants(Pvt) Ltd.
- **සුදර්ශනී එලියපුර** - අධ්‍යක්ෂිකා, Touch of Gold
- **සඳුන් අතපත්තු** - ප්‍රධාන අලෙවි නිලධාරී, SUT (Pvt) Ltd.

# තිස්වක් වැනි සුමති සම්මාන උළෙලේ ආරම්භයට පෙර මතකාවර්ජනය





ශ්‍රී ලංකාවේ සමාරම්භක ටෙලි සම්මාන උළෙල මෙන්ම වඩාත් කැපී පෙනෙන සිනමා සම්මාන උළෙල යනු වසරක් ගෙවී ඊළඟ වසර එළඹෙනතුරු ටෙලි තාරකාවන් මඟ බලා සිටින උත්සවයක් බව නොරහසකි. තිස් වසරක් පසුකොට තිස් එක් වන වසරට පා තබන "සුමති සම්මාන උළෙල" පිළිබඳ මතකාවර්ජනය මෙසේ වෙයි.

ශ්‍රී ලාංකේය සමාජ විඥානය ගොඩනඟනු පිණිස රූපවාහිනී මාධ්‍යය ජනතාව වෙත කරන බලපෑම සුළුපටු නොවේ. දේශීය ටෙලිනාට්‍ය පමණක් නොව රූපවාහිනී වැඩසටහන් ද අගයමින් එහි ප්‍රතිභාව පලකළ නළු, නිළියන් ඇතුළු අනෙකුත් ශිල්පීන්ගේ දක්ෂතා පුළුල් ලෙස නිරීක්ෂණය කරමින් එම කලාකරුවන් අගයන "සුමති සම්මාන උළෙල" ශ්‍රී ලංකාවේ පමණක් නොව ආසියාවේම ප්‍රථම ටෙලිනාට්‍ය සම්මාන උළෙල බවද මෙහිදී සිහිපත් කළ යුතුය.

මීට වසර හතළිස් පහකට පෙර රූපවාහිනිය මෙරට ජනතාව විසින් මහත් සෙනෙහසින් වැළඳ ගනු ලැබූ අතර 1983 වසරේදී ප්‍රවීණ සිනමා අධ්‍යක්ෂක ඩී. බී. නිහාල්සිංහ ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයට පා තබමින් 'දිමුතු මුතු' නමින් ප්‍රේක්ෂකයා වෙත තිළිණ කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම ටෙලිනාට්‍ය ප්‍රේක්ෂකයාට නවමු අත්දැකීමක් විය. ටෙලිනාට්‍ය ජනප්‍රිය වුවද සිනමා කලාකරුවන් මිස ටෙලිනාට්‍ය ශිල්පීන් ඇගැයීමේ සම්මාන උළෙලක් නොවූ අතර 1995 වසරේදී වර්තමාන සුමති සම්මාන සභාපති තිලංග සුමතිපාල මහතාගේ සංකල්පයක් ලෙස "සුමති සම්මාන උළෙල" ඇරඹුණේ ඒ අඩුපාඩුව පුරවාලමිනි.









මේ වනවිට ප්‍රථම ටෙලි නාට්‍යය බිහිවී දශක හතරක් ගතවී ඇති අතර "සුමති සම්මාන උළෙල" මෙවර පැවැත්වෙන්නේ තිස්එක් වැනි වරටය. 'දිමුතු මුතු' විකාශය වී ගතවූ කාල පරාසය තුළ ටෙලිනාට්‍ය නමැති දෘශ්‍ය කලා ප්‍රවර්ගයේ පරිණාමීය විකාශනය රූපවාහිනී කර්මාන්තමය ලක්‍ෂණ සමඟ මේ වනවිට ප්‍රමුඛව බැඳී ඇති බව පැහැදිලිව පෙනෙනා කරුණකි. ටෙලිනාට්‍යය විද්‍යුත් කතන්දර කියන්නා ලෙස ජනප්‍රිය හා කලාත්මක ලක්‍ෂණවලින් සමන්විතව ශ්‍රී ලාංකේය ප්‍රේක්‍ෂකයා වෙත අනුගත විය. එහිදී මෙවන් සම්මාන උළෙලක් තිස්එක් වැනි වරටත් පැවැත්වීම යනු රූපවාහිනී මාධ්‍යයේ ප්‍රමිතිය පවත්වාගෙන යෑම සඳහා එහි නිරත වන්නන් දිරිගැන්වීමට මෙන්ම, අප රටේ සමාජ සංස්කෘතියට හිතකර සමාජානුයෝජනය කිරීම වෙනුවෙන් අගය කිරීම මෙන්ම තවදුරටත් මෙම කර්මාන්තයේ නිරතවීම සඳහා කලාකරුවන් හා වෙනත් ශිල්පීන් උනන්දු කරවීමට ද හේතුවූ බව නොරහසකි.

ගතවූ කාලය තුළ ටෙලිනාට්‍ය තුළ වර්ධනය වූ සාධනීය ලක්‍ෂණ ලෙස ශ්‍රී ලාංකේය සමාජය තුළ මුල් බැස ගෙන ඇති කතා පුවත්වලට ක්‍රමයෙන් එහා යමින් නව තේමාවන් නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කිරීම වෙත අවධානය යොමුකර තිබීම කැපී පෙනෙයි. ජනප්‍රියත්වය තකා පමණක් ටෙලිනාට්‍යය නිර්මාණය කිරීමෙහි නොයෙදී ගුණාත්මක ලෙස හා ව්‍යාපාරික ආධිපත්‍ය පෙසක ලා රූපවාහිනී ප්‍රේක්‍ෂකයා වෙත නවමු තේමාවන්ගෙන් යුතු නිර්මාණ ඉදිරිපත් කිරීමට ටෙලිනාට්‍යවේදීන් ඉදිරිපත්ව තිබීම වර්තමානයේදී කැපී පෙනෙයි. එබැවින් තරඟකාරී ටෙලි කර්මාන්ත ලක්‍ෂණවලට අවශ්‍ය ජනප්‍රිය සාධක පමණක් නොව ගුණාත්මක සාධක සඳහා මෙවැනි ඇගැයුම් උළෙලක් පැවැත්වීම වඩාත් විශ්වසනීය මාධ්‍යයක් ලෙස රූපවාහිනී මාධ්‍යය ජනප්‍රසාදයට පත්වීමට හේතු වී තිබේ.

මීට තිස් වසරකට පෙර තිලංග සුමතිපාල නම් වූ තරුණ ව්‍යවසායකයා ටෙලිනාට්‍ය සම්මාන උළෙලක් පිළිබඳ අත්දැකීම් මෙරට නොවූ කලක ටෙලිනාට්‍ය කර්මාන්තයේ නියැළෙන නළු නිළියන් ඇතුළු අනෙකුත් ශිල්පීන් අගැයීමට ගත් උත්සාහය කලාව පිළිබඳ ඔහුගේ යහපත් ආකල්ප ප්‍රදර්ශනය කරයි. එසේ වීම අහම්බයක් නොවේ. ඔහුගේ පියා වූ යූ. ඩබ්ලිව් සුමතිපාලයන් මෙන්ම මව් වන මිලිනා සුමතිපාල මැතිණිය ද කලාත්මක සිනමාව පෝෂණය කිරීමෙහි ලා කිසිදු ලාභ අපේක්‍ෂාවකින් තොරව කැපවූ ආකාරය පිළිබඳ අත්දැකීම ඊට හේතුවන්නට ඇත. මේ ව්‍යාපාරික පවුල මෙරට සිනමාවට මෙන්ම ටෙලිනාට්‍ය ක්‍ෂේත්‍රයට දැක්වූ දායකත්වය ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

රාජ්‍ය හා පෞද්ගලික මට්ටමින් ශ්‍රී ලාංකේය කලාකරුවන්ට සම්මාන ලබා දෙන සම්මාන උළෙලවල් හා සැසඳීමේදී "සුමති සම්මාන උළෙල"වඩාත් වැදගත් වන්නේ කෙසේද ? බොහෝ නාට්‍ය, සිනමා හා ටෙලි සම්මාන උළෙලවල් රාජ්‍ය හා පෞද්ගලික මට්ටමින් කලක සිට පැවතිය ද නොකඩවා එබඳු උළෙලවල් පවත්වා නැත. ඉහත ඇතැම් සම්මාන උළෙලවල් ආරම්භවී මේ දක්වා පැවැත්වුණ ද, ආරම්භ කළ වසරේ සිට අද දක්වා ගණන් කර බැලීමේදී එම සම්මාන උළෙල අඛණ්ඩව පවත්වා

නැති බව පැහැදිලිව පෙනේ. නමුත් තිලංග සුමතිපාල මහතා ආරම්භ කළ "සුමති සම්මාන උළෙල" තිස් වසරක් පවත්වා මෙවර තිස්එක් වැනි වරටත් නොකඩවා පැවැත්වීම සුවිශේෂී සිදුවීමක් නොවන්නේද?

"සුමති සම්මාන උළෙල" යනු සාම්ප්‍රදායිකත්වය ආරක්ෂා කරගන්නා අතරේ නූතන සමාජය ද ස්පර්ශ කොට යථාවබෝධයෙන් යුතුව පවත්නා සම්මාන උළෙලකි. වසරින් වසර ටෙලි කර්මාන්තය මෙන්ම අලුත් වෙමින් ග්‍රාෆිකකරණය, සමාජ මාධ්‍ය, ඩිජිටල් දැන්වීම්කරණය ආදී ආනුශංගික කලා ධාරා ඇතුළත් කර "සුමති සම්මාන උළෙල"සංවිධානය කරනු ලබයි.

මෙම සම්මාන උළෙල තිස් එක් වැනි වරටත් පැවැත්වීම සඳහා අවශ්‍ය නිවැරදි විනිශ්චයන් ලබාදෙමින් දායකත්වය දැක්වූ සභාපතිවරුන් ඇතුළු විනිශ්චය මණ්ඩල සාමාජික සාමාජිකාවන් ද මෙහිදී ගෞරවයෙන් සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර නිදහස් විනිශ්චයක් ලබාදීම සඳහා "සුමති සම්මාන උළෙල" සභාපති තිලංග සුමතිපාල මහතා ලබා දුන් සහය ද ගෞරවයෙන් සිහිපත් කරමි. මෙහිදී මහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කළ යුතු තවත් පිරිසක් වන්නේ සුමතිපාල අනුස්මරණ සම්මාන ලබාගත් හෙළයේ මහා කලාකරුවන් හා එදාමෙදාතුර විවිධ අංශ සඳහා සම්මාන ලබා ගත් සෙසු ශිල්පීන්ය.

මෙතෙක් පැවැති සම්මාන උළෙල තිස් එකේදී නළු නිළියන්, කාර්මික ශිල්පීන්, පිටපත් රචකයන්, සහාය නළුවන් හා නිළියන්, නැඟී එන නළු නිළියන්, හොඳම ළමා රංගනය මෙන්ම ජූරියේ විශේෂ සම්මාන හා කුසලතා සම්මාන, අධ්‍යක්ෂවරුන් හා ටෙලිනාට්‍ය නිෂ්පාදනය සඳහා සම්මාන ඇතුළු සම්මාන රැසක් පිරිනමා තිබේ.

එමෙන්ම මෙහිදී ජනප්‍රිය ටෙලිනාට්‍ය, ජනප්‍රිය නළුවා හා ජනප්‍රිය නිළිය යන අංශ සඳහා ටෙලිනාට්‍ය නරඹන්නන් විසින් ලබාදෙන තීරණයට අනුව සම්මාන ලබාදෙමින් විනිශ්චය මණ්ඩලයේ පමණක් නොව ප්‍රේක්ෂකයාගේ කැමැත්තට ද ඉඩදීමට තිලංග සුමතිපාල මහතා ඇතුළු සංවිධායක මණ්ඩලය කටයුතු යොදා තිබේ.

31 වන සුමති සම්මාන උළෙලේ ඇගැයුමට ලක්වන්නේ 2025 වසරේ විකාශය වූ ටෙලි නිර්මාණ හා වෙනත් වැඩසටහන්ය. ඒ අනුව ටෙලිනාට්‍ය, ඒකාංගික හෝ ටෙලි චිත්‍රපට, ඩිජිටල් ඇනිමේෂන්, සංගීත වැඩසටහන්, ක්‍රීඩා වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, වාර්තා වැඩසටහන්, කාලීන වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, ළමා වැඩසටහන්, ගවේෂණශීලී වැඩසටහන්, කාලීන ප්‍රවෘත්ති වාර්තාකරණය, පූරක, ප්‍රවෘත්ති නිවේදක/ නිවේදිකාවන්, ප්‍රවෘත්ති විකාශන හා දේශපාලන වැඩසටහන් යන අංශ සඳහා රූපවාහිනී ආයතන විසින් නිර්මාණ රැසක් ඉදිරිපත් කොට තිබූ අතර විනිශ්චය මණ්ඩලය විසින් මහත් කැපවීමෙන් යුතුව ඒ සියල්ල නිරීක්ෂණයට ලක් කරන ලදී.

පෙර වර්ෂවල ඉදිරිපත් කළ නිර්මාණවල සාධනීය ලක්ෂණ හෝ ටෙලි නාට්‍යයක පැවැත්විය යුතු හා නොපැවැත්විය යුතු ලක්ෂණ පිළිබඳව සමාලෝචනයක් කිරීමට අප අදහස් නොකරමු. ගතවන වසරක් පාසා ටෙලි නිර්මාණ, ඊට දායක වූ කලාකරුවන් ඇතුළු සෙසු ශිල්පීන් මෙන්ම වෙනත් අංග සඳහා නිර්මාණ ඉදිරිපත් කර ඇති ශිල්පීන්ගේ ද දක්ෂතා පවතින තත්ත්වයෙන් තවදුරටත් ඉහළට ඔසවා තැබීම "සුමති සම්මාන උළෙලේ" ප්‍රධාන අරමුණ වේ.

**සම්මානිත මහාචාර්ය**
**මුදියන්සේ දිසානායක**
(PhD, MA, BFA, Diploma)
**සුමති සම්මාන විනිශ්චය මණ්ඩලයේ සභාපති**



සුමති සම්මාන
SUMATHI AWARDS

# සම්මාන සඳහා නිර්දේශිත නාම - 2025

**2025 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා**

## 1. හොඳම ටෙලිනාට්‍යය නළුවා






- **සෞම්‍ය ලියනගේ** -'THE LAKE' (බොනී- ග්‍රෑන්ඩිසන්) - (ජාතික රූපවාහිනී)
- **සම්පත් ජයවීර** - "පැබ්ලෝ" (පැබ්ලෝ) - (ස්වර්ණවාහිනී)
- **අකලංක ප්‍රභාෂ්වර** - "රට පවුල" (ධනුක) - (ස්වර්ණවාහිනී)
- **චරිත් අබේසිංහ** - "බඹරෙක් ඇවිත්" (විපුල) - (හිරු ටීවී)

## 2. හොඳම ටෙලිනාට්‍ය නිළිය






- **තරින්දි ප්‍රනාන්දු** - “ඉර ගිනි මද්දහන” (සමන්තා) - (ජාතික රූපවාහිනී)
- **යුරේනි නොෂිකා** -“රීකන්ඩිෂන් කෙල්ල” (දිනූ) - (ස්වර්ණවාහිනී)
- **අප්සරා ගුණතිලක** - “සසංකාරා” (ග්‍රේස්) - (ස්වාධීන රූපවාහිනී)
- **ජයනි සේනානායක** - “රට පවුල” (දමයන්ති) - (ස්වර්ණවාහිනී)

## 3. හොඳම ටෙලිනාට්‍ය සහාය නළුවා






- **සේවියර් කනිෂ්ක** -'THE LAKE' (කීත්) - (ජාතික රූපවාහිනී)
- **වසන්ත මොරගොඩ** - “සසංකාරා” (හේරත් හාමි) - (ස්වාධීන රූපවාහිනී)
- **සනත් විමලසිරි** - “රට පවුල” (ධර්මරත්න) - (ස්වර්ණවාහිනී)
- **ධනංජය සිරිවර්ධන** - “පාවී එන්න ආසයි” (සමන්ත) - (හිරු ටීවී)

## 4. හොඳම ටෙලිනාට්‍ය සහාය නිළිය






- **චාන්දනී සෙනෙවිරත්න** - (රීකන්ඩිෂන් කෙල්ල) “අම්මා” - (ස්වර්ණවාහිනී)
- **චම්පා ශ්‍රියාණි** - “සසංකාරා” (සිංගි අම්මා) - (ස්වාධීන රූපවාහිනී)
- **තුෂිනි ප්‍රනාන්දු** -'LOVER’S LEAF' (නුරානි)- (සිරස ටීවී)
- **චමත්කා ලක්මිණි** -'THE LAKE' (හිරන්‍යා) - (ජාතික රූපවාහිනී)

## 5. වසරේ නැගී එන ටෙලිනාට්‍ය නළුවා






- **චතුරංග කොඩිතුවක්කු - (සචිත්‍ර)** "වීදුරු තිර" - (ස්වාධීන රූපවාහිනී)
- **සුදර්ශන ක්‍රිෂාන්ත - (ආතර්)** - "පැබ්ලෝ"- (ස්වර්ණවාහිනී)
- **අභිෂේක් ප්‍රමුදිත - (රන්දුනු)** 'LOVER'S LEAP' - (සිරස ටීවී)
- **ධම්මික බණ්ඩාර - (නිමල්)** - "බඹරෙක් ඇවිත්" - (හිරු ටීවී)

## 6. වසරේ නැගී එන ටෙලිනාට්‍ය නිළිය






- **ප්‍රගා මිෂෙල්** - "රට පවුල" (අප්සරා) - (ස්වර්ණවාහිනී)
- **විනූ පෙරේරා** - "බඹරෙක් ඇවිත්" (මල්කාන්ති) - (හිරු ටීවී)
- **අංජලී ජයසිංහ** - 'LOVER'S LEAP' (ආන්යා) - (සිරස ටීවී)
- **මංචනා පලිහවඩන**- 'THE LAKE' (රුක්මණී - යොවුන් විය - (ජාතික රූපවාහිනී)

## 7. හොඳම ටෙලිනාට්‍ය (ප්‍රාසංගික)










- 'THE LAKE' - සේමිනි ඉද්දමල්ගොඩ / අතුල ඉද්දමල්ගොඩ / - (ජාතික රූපවාහිනී)
- **"සසංකාරා"** - එච්. ඩී. ප්‍රේමසිරි/චන්න ප්‍රනාන්දු/බන්දුල ඒකනායක/බණ්ඩාර ඇහැළියගොඩ - (ස්වාධීන රූපවාහිනී)
- **"රට පවුල"** - එස්. රමේෂ් - (ස්වර්ණවාහිනී)
- **"ඉර ගිනි මද්දහන"** - ඉරෝෂ් විජේසූරිය - (ජාතික රූපවාහිනී)

### 8. හොඳම ටෙලිනාට්‍ය තිර රචනය

- **නලින් ලුසේනා** - "පැබිලෝ" - (ස්වර්ණවාහිනී)
- **කෞශල්‍ය පතිරණ** - "රට පවුල" - (ස්වර්ණවාහිනී)
- **සුසිත් විජේමුනි / දිලූෂිකා රාජපක්ෂ** - "අමුතු දොස්තර" - (ජාතික රූපවාහිනී)
- **ප්‍රියන්ත ප්‍රනාන්දු / අරුණ ප්‍රේමරත්න / ලාල් වසන්ත** - "සසංකාරා" - (ස්වාධීන රූපවාහිනී)

### 9. හොඳම ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණය

- **හසුන් සමීර** - "රට පවුල" (ස්වර්ණවාහිනී)
- **ජයප්‍රකාශ් සිවගුරුනාදන්** - "පැබිලෝ" - (ස්වර්ණවාහිනී)
- **ප්‍රියන්ත ප්‍රනාන්දු** - "සසංකාරා" - (ස්වාධීන රූපවාහිනී)
- **කෝරලගේ සමන්** - "අමුතු දොස්තර" - (ජාතික රූපවාහිනී)

### 10. හොඳම ටෙලිනාට්‍යය ගීත රචනය

- **රසික සුරවීර ආරච්චි** -"ඔහු ගිනි ගනී"- 'THE LAKE' - (ජාතික රූපවාහිනී)
- **බන්දුල ඒකනායක** - "මේ ජීවිතය හරි බරයි" - "සසංකාරා"- (ස්වාධීන රූපවාහිනී)
- **තරංගා දිසානායක** - "ඉරත් ගිනි ගෙන" - "ඉර ගිනි මද්දහන" - (ජාතික රූපවාහිනී)
- **තුෂානි බුළුමුල්ල** - "සඳ තාරකා නිදනා රැයේ"- "අමුතු දීගේ" - (ජාතික රූපවාහිනී)

### 11. හොඳම ටෙලිනාට්‍ය ගායනය

- **මිදෝරි කරුණාතිලක** - "ඊකන්ඩිෂන් කෙල්ල" - "කාලයේ තටු" - (ස්වර්ණවාහිනී)
- **සියුමැලි ඔපයංගි** -"ඉරත් ගිනි ගෙන"-"ඉර ගිනි මද්දහන"- (ජාතික රූපවාහිනී)
- **සමන්ත පෙරේරා** - "සසංකාරා" - "මේ ජීවිතය හරි බරයි"- (ස්වාධීන රූපවාහිනී)
- **ගිහාන් බණ්ඩාර** - "සීසෝ" - "රැල්ල බිඳිනවා"- (ජාතික රූපවාහිනී)

### 12. හොඳම ටෙලිනාට්‍ය අංග රචනය (වේෂ නිරූපණය)

- **වාසනා බණ්ඩාර විජේකෝන්** - "පැබිලෝ" - (ස්වර්ණවාහිනී)
- **ප්‍රියන්ත එස්. වන්නිනායක** - "සසංකාරා" - (ස්වාධීන රූපවාහිනී)
- **බුවනෙක රණවක** - "බඹරෙක් ඇවිත්" - (හිරු ටීවී)
- **ගාමිණී කොස්තා** - "සීසෝ" - (ජාතික රූපවාහිනී)

### 13. හොඳම ටෙලිනාට්‍ය කලා අධ්‍යක්ෂණය

- **නුවන් විජේසිංහ / පියතිස්ස අකුරන්ගොඩ /** - "සසංකාරා" - (ස්වාධීන රූපවාහිනී)
- **මාලින්ද බුලත්සිංහල / දිලීප විජිත්ශාන්** - 'THE LAKE' - (ජාතික රූපවාහිනී)
- **සරත්චන්ද්‍ර ජයවීර** - "බඹරෙක් ඇවිත්" - (හිරු ටීවී)
- **තනුජ ගමගේ** - "අමුතු දොස්තර" - (ජාතික රූපවාහිනී)

## 14. හොඳම ටෙලිනාට්‍ය සංස්කරණය

- **අනූෂ ජයවර්ධන / වරුණ කොඩිකාර** - "පැබ්ලෝ" - (ස්වර්ණවාහිනී)
- **නාමල් සමරතුංග** - 'THE LAKE' - (ජාතික රූපවාහිනී)
- **චන්දන ලියනගේ / අජිත් දිසාසේකර** - "රට පවුල" - (ස්වර්ණවාහිනී)
- **බුද්ධික රණසිංහ** - "සසංකාරා" - (ස්වාධීන රූපවාහිනී)

## 15. හොඳම ටෙලිනාට්‍ය සංගීත අධ්‍යක්ෂණය

- **විදූ කහපොලආරච්චි /ගයාන් අමරසූරිය / දිල්හාර නන්දසිරි** - 'THE LAKE' - (ජාතික රූපවාහිනී)
- **අචල සොලමන්ස්** - "පැබ්ලෝ" - (ස්වර්ණවාහිනී)
- **දර්ශන රුවන් දිසානායක** - "ඉර ගිනි මද්දහන" - (ජාතික රූපවාහිනී)
- **සමන්ත පෙරේරා** - "සසංකාරා" - (ස්වාධීන රූපවාහිනී)

## 16. හොඳම ටෙලිනාට්‍යය කැමරා අධ්‍යක්ෂණය

- **චින්තක සෝමකීර්ති** - 'THE LAKE' - (ජාතික රූපවාහිනී)
- **ප්‍රභාත් දර්ශන** - "පැබ්ලෝ" - (ස්වර්ණවාහිනී)
- **චින්තක සෝමකීර්ති** - "අමුතු දොස්තර" - (ජාතික රූපවාහිනී)
- **කපිල සුදත්** - "බඹරෙක් ඇවිත්" - (හිරු ටීවී)

## 17. හොඳම ටෙලි චිත්‍රපටය

- **"ලොකු වුණාම වෙන්නෙ කවුද ?"** - හිරු ටීවී - (හිරු ටීවී)
- **"ආවේශය"** - කේ.ජී. අතුල පීරිස් - (ජාතික රූපවාහිනී)
- **"මම මා නොව"** - සමන් ප්‍රියන්ත විජේතුංග - (ටීවී දෙරණ)
- **"සහෝදරයෝ** - දිලුක ප්‍රසාද් ගුණතිලක - (ජාතික රූපවාහිනී)

## 18. හොඳම රූපවාහිනී වාර්තා වැඩසටහන

- 'SAVE THE LEOPORD' - කසුන් උදයංගආරච්චි - (සිරස ටීවී)
- **"පුස්කොළ ලිවීම"** - විරාජ් ධර්මදාස - (ජාතික රූපවාහිනී)
- 'BLACKSPOT' - අමිත් ප්‍රියංජන් - (ශ්‍රද්ධා රූපවාහිනී)
- **"මහේශාක්‍ය සොබා රාජ්‍යය"** - ජනිතා ලියනගේ - (අද දෙරණ)

## 19. හොඳම රූපවාහිනී සංගීත වැඩසටහන

- **"ජාන"** - චින්තක ගම්ලත් - (හිරු ටීවී)
- 'IMORICH TUNES' - ධම්මික ෆොන්සේකා / අයේෂා රාජරත්නම් - (සිරස ටීවී)
- **"සනුහරේ"** - චින්තක ගම්ලත් - (හිරු ටීවී)
- **"යුගාත්‍රා"** - විමුක්ති රොද්‍රිගු - (ටීවී දෙරණ)

## 20. හොඳම රූපවාහිනී කාලීන වැඩසටහන

- **"අලුත් පාර්ලිමේන්තුව"** - ප්‍රසාද් කුමසාරු - (ටීවී දෙරණ)
- 'REBUILD SRI LANKA' - රුක්මල් මල්ලව - (ටීවී දෙරණ)
- 'GLOBAL ANGLE' - අඳුන් ඉඳුවර ලියනගේ - (අද දෙරණ)
- **ඇය** - ආශා ලියනගේ - (සියත ටීවී)

## 21. හොඳම රූපවාහිනී සඟරාමය වැඩසටහන

- 'ROAD TO WEEKEND' - කසුන් රාජපක්ෂ - (ටීවි සුප්‍රීම්)
- 'ANYONE CAN COOK' - ලසිත ගුණසේකර - (හිරු ටීවී)
- **"සංචාරේ"** - සුරේෂ් ද අල්විස් - (ස්වර්ණවාහිනි)
- 'SMART AGRO' - ලසන්ත රුමේෂාන් තිලකසිරි - (ජාතික රූපවාහිනී)

## 22. හොඳම රූපවාහිනී ක්‍රීඩා වැඩසටහන

- 'SPORTS **නම් සුප්‍රීම්**' - ලිලාන් රුවන්වැල්ල - (ටීවී සුප්‍රීම් )
- '18 + CHAMP' - ජයම්ණි ඉලේපෙරුම - (ජාතික රූපවාහිනී)
- **"කෙළිබිම"** - කසුන් කුමාර / අශාන් ප්‍රනාන්දු - (අද දෙරණ)
- **"කෙළි බිම** - THE SPORTS DESK' - ධනුෂ්ක ප්‍රියදර්ශන/සාලිය වීරසිංහ (ස්වර්ණවාහිනී)

## 23. හොඳම රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන

- .SUPER HEROES' - ශානක රණතුංග -  (සිරස ටීවී)
- **"ජීවිතයට විද්‍යාව"** - කේ. සී. සාරංග - (අද දෙරණ)
- 'DBATOR" - ශානක රණතුංග - (සිරස ටීවී)
- **"ජාතික පාසැල"** - නිලූෆා මොහොට්ටි - (ජාතික රූපවාහිනී)

## 24. හොඳම රූපවාහිනී ළමා වැඩසටහන

- **"හපන් පැදුර"** - තරිඳු අනුපම - (ස්වර්ණවාහිනී)
- **"ඩේන්ටී රස පැන"** - මනෝජ් ප්‍රසන්න - (සිරස ටීවී)
- **"හැදෙන අපට හදන කෑම"** - තරංගි අතුරලිය - (ජාතික රූපවාහිනී
- **විස්මිත විස්කම්** - රොෂාන් එම්. වන්නිආරච්චි - (ශ්‍රද්ධා ටීවී)

## 25. හොඳම රූපවාහිනී ග්‍රාෆික සජීවීකරණය (3D DIGITAL ANIMATION)

- **අපේ පොසොන්** - (නිපුන් පවිත්‍ර සහ පසිඳු දයාරත්න - (ටීවී දෙරණ)
- **හිරු නත්තල්** - (පසු නිෂ්පාදන අංශය) - (හිරු ටීවී)
- **හිරු වෙසක්** - (පසු නිෂ්පාදන අංශය) - (හිරු ටීවී)
- **සිරස** Dancing Star -  (ජී. එල්. පවන් විතානගේ) - (සිරස ටීවී)

සුමති සම්මාන
SUMATHI AWARDS

## 2026 ජනප්‍රිය සම්මාන ටෙලිනාට්‍ය

සුමති සම්මාන උළෙලේ ඉතාම ආකර්ෂණීය සහ උත්කර්ෂවත්ම අංගය වනුයේ ප්‍රේක්ෂක මනාපයෙන් සම්මානයට පාත්‍රවන ජනප්‍රිය කාණ්ඩයෙන් ජනප්‍රිය නළුවා, ජනප්‍රිය නිළිය, ජනප්‍රිය ටෙලිනාට්‍ය යන කාණ්ඩ යටතේ පිරිනැමෙන සම්මාන ත්‍රිත්වයයි. මේ දිනවල සියලුම නාලිකාවල විකාශය වන ටෙලිනාට්‍ය අතරින් යෝජිත නාමයන් මේ සඳහා ඇතුළත් කර ඇත. මෙවර සුමති සම්මාන ෆේස්බුක් පිටුව (Sumathi Awards Facebook Page) ප්‍රේක්ෂකයන් වෙත කරනු ලැබූ නිවේදනයක් තුළින් යෝජනා වූ නම් ඇතුළත් කරමින් ජනප්‍රිය ලැයිස්තුව සැකසීම සිදු කරනු ලැබේ.

ජනප්‍රිය කාණ්ඩයට අදාළ තොරතුරු සුමති සම්මාන ෆේස්බුක් පිටුව (Sumathi Awards Facebook Page) හරහා දැනුවත් විය හැකිය. එස්. එම්. එස් (SMS) මනාපයන් සහ සුමති සම්මාන වෙබ් පිටුව (www.sumathiawards.lk) හරහා ජනප්‍රිය සම්මානය සඳහා වන මනාපයන් පළ කළ හැකිය. සුමති සම්මාන වෙබ් පිටුව හරහා විදේශගත ශ්‍රී ලාංකික රසිකයන් හට තම මනාපය පළ කිරීමේ අවස්ථාව හිමිවන අතර මනාප ප්‍රතිඵලයන් හා සම්මාන උළෙල පිළිබඳ සියලු තොරතුරු "Sumathi Awards" Facebook පිටුවෙන් සහ (www.sumathiawards.lk) වෙබ් අඩවිය මගින් දැන ගැනීමට හැකියාව ඇත.



පාට කුරුල්ලෝ



ජහුටා



පට්ටි ගෙදර



රොන් සොයා


ජැෆ්නාදරය



හුස්මක් ළඟින්


සිහිනයක තනිවෙලා


වරකත

2026 ජූලි 07 දින ප.ව 6.00 වනවිට ලැබුණු ප්‍රතිඵල අනුව පෙළගස්වා ඇත.

# 31 වැනි සුමති සම්මාන රාත්‍රියේ
# වැඩසටහන් පෙළගැස්ම

| 31 වැනි සුමති සම්මාන රාත්‍රියේ සමාරම්භය | |
|---|---|
| | සරස්වතී අභිනන්දනය සහ තේමා ගීතය - චන්න විජේවර්ධන නර්තන කණ්ඩායම |
| | පොල්තෙල් පහන්සිළු දැල්වීම |
| | ජූරිය හඳුන්වාදීම |
| **පියවර 1** | |
| 01 | කුසලතා සම්මාන 2025) |
| 02 | කුසලතා සම්මාන (2025) |
| 03 | ළමා තාරකාව (2025) |
| 04 | නැඟී එන ටෙලිනාට්‍ය නළුවා (2025) |
| 05 | නැඟී එන ටෙලිනාට්‍ය නිළිය (2025) |
| 06 | හොඳම රූපවාහිනී වාර්තා වැඩසටහන (2025) |
| 07 | හොඳම රූපවාහිනී සංගීත වැඩසටහන (2025) |
| 08 | හොඳම රූපවාහිනී කාලීන වැඩසටහන (2025) |
| 09 | හොඳම රූපවාහිනී පූරක (2025) |
| **පියවර 2** | |
| 10 | හොඳම රූපවාහිනී සඟරාමය වැඩසටහන (2025) |
| 11 | හොඳම රූපවාහිනී ක්‍රීඩා වැඩසටහන (2025) |
| 12 | හොඳම රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන (2025) |
| 13 | හොඳම රූපවාහිනී ළමා වැඩසටහන (2025) |
| 14 | හොඳම රූපවාහිනී ග්‍රාෆික සජීවිකරණය (2025) |
| 15 | ජූරියේ විශේෂ සම්මාන (2025) |
| 16 | ජූරියේ විශේෂ සම්මාන (2025) |
| | **විශේෂාංග** |
| | විශේෂ කතාව - සුමති සම්මාන සභාපති ආචාර්ය තිලංග සුමතිපාල මහතා |

## පියවර 3

17 වසරේ ජනප්‍රියතම රූපවාහිනී වැඩසටහන
18 වසරේ ජනප්‍රියම නළුවා
19 වසරේ ජනප්‍රියම නිළිය
20 වසරේ ජනප්‍රියම ටෙලිනාට්‍ය

## පියවර 4

22 හොඳම රූපවාහිනී වෙළෙඳ දැන්වීම - කුසලතා
23 හොඳම රූපවාහිනී වෙළෙඳ දැන්වීම - 3
24 හොඳම රූපවාහිනී වෙළෙඳ දැන්වීම - 2
25 හොඳම රූපවාහිනී වෙළෙඳ දැන්වීම - 1
26 ඩිජිටල් මාධ්‍ය වෙළෙඳ දැන්වීම - 2
27 ඩිජිටල් මාධ්‍ය වෙළෙඳ දැන්වීම - 1

**විශේෂාංග**

## පියවර 5

28 හොඳම සමාජ මාධ්‍ය - අධ්‍යාපන වැඩසටහන
29 හොඳම සමාජ මාධ්‍ය - විනෝදාත්මක වැඩසටහන
30 හොඳම සමාජ මාධ්‍ය - උරුමයන් පිළිබඳ වැඩසටහන
31 හොඳම සමාජ මාධ්‍ය - ජාතික අවශ්‍යතා වැඩසටහන
32 හොඳම සමාජ මාධ්‍ය - කාලීන වැඩසටහන
33 හොඳම සමාජ මාධ්‍ය - ජීවන රටා සහ විලාසිතා

## පියවර 6

34 හොඳම රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදක 2 (2025)
35 හොඳම රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදක 1 (2025)
36 හොඳම රූපවාහිනී ගවේෂණශීලී වාර්තාකරණය - 2 (2025)
37 හොඳම රූපවාහිනී ගවේෂණශීලී වාර්තාකරණය - 1 (2025)
38 වසරේ දේශපාලන වැඩසටහන 3
39 වසරේ දේශපාලන වැඩසටහන 2
40 වසරේ දේශපාලන වැඩසටහන 1
41 හොඳම කාලීන ප්‍රවෘත්ති වාර්තාකරණය - 2 (2025)
42 හොඳම කාලීන ප්‍රවෘත්ති වාර්තාකරණය - 1 (2025)
43 හොඳම රූපවාහිනී ප්‍රවෘත්ති විකාශනය (2025)

**විශේෂාංග**

## පියවර 7

44 හොඳම ටෙලිනාට්‍ය ගීත රචනය (2025)
45 හොඳම ටෙලිනාට්‍ය ගීත ගායනය (2025)
46 හොඳම ටෙලිනාට්‍ය අංගරචනය (2025)
47 හොඳම ටෙලිනාට්‍ය කලා අධ්‍යක්ෂක (2025)
48 හොඳම ටෙලිනාට්‍ය සංස්කරණය (2025)
49 හොඳම ටෙලිනාට්‍ය සංගීත අධ්‍යක්ෂක (2025)
50 හොඳම ටෙලිනාට්‍ය කැමරා අධ්‍යක්ෂණය (2025)
51 හොඳම ටෙලි චිත්‍රපටය (2025)

## පියවර 8

52 සුමතිපාල අනුස්මරණ සම්මානය

**විශේෂාංග**

53 සුමතිපාල අනුස්මරණ සම්මානය

## පියවර 9

54 හොඳම ටෙලිනාට්‍ය සහය නළුවා (2025)
55 හොඳම ටෙලිනාට්‍ය සහය නිළිය (2025)
56 හොඳම ටෙලිනාට්‍ය නළුවා (2025)
57 හොඳම ටෙලිනාට්‍ය නිළිය (2025)
58 හොඳම ටෙලිනාට්‍ය තිර රචනය (2025)
59 හොඳම ටෙලිනාට්‍ය අධ්‍යක්ෂක (2025)
60 හොඳම ප්‍රාසාංගික ටෙලිනාට්‍ය (2025)

සුමති සම්මාන
SUMATHI AWARDS
2026

## EVENT ASSOCIATES

Showtown Entertainment Private Limited

SGM Technologies

SGM Media

RGB Event Private Limited

Mr. Channa Wijewardena (Channa-Upuli Performing Arts Foundation)

Gayan Srimal Dance Troupe

Thilina Ben Photography

Napco Private Limited

Rabbit Solutions Private Limited

Dananjaya Bandara of DB

Mr. Asanka De Mel of Lovi

සුමති සම්මාන 2026
සමරු කලාපයේ
QR පිවිසුම

sumathiawards.lk

31 සුමති සම්මාන
SUMATHI AWARDS | 2026

Touch of Gold
Monarch Imperial
napco
Your Impression is Our Responsibility
HOME LANDS
TRUST | INNOVATION | EXCELLENCE
THi
SUMATHI VENTURES
RESISTANCE
COMMERCIAL BANK
LOVI CEYLON
DHANANJAYA BANDARA